සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 - (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - (2025)
Year End Evaluation - 2024 - (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි. |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නමකි,
   i. දුක් විඳින්නන්ගේ ශුභාරංචිය
   ii. දයාවේ ශුභාරංචිය
   iii ප්‍රශංසාවේ ශුභාරංචිය
   iv. ගැලවීමේ ශුභාරංචිය

2. ශ්‍රීමත් තියෝපිලස්තුමන්ට පිළිගන්වා ඇති ශුද්ධ බයිබලයේ අඩංගු ග්‍රන්ථ දෙක වන්නේ,
   i. ලූක් ශුභාරංචිය හා එළිදරව්ව
   ii. ජොහන් ශුභාරංචිය හා එළිදරව්ව
   iii ලූක් ශුභාරංචිය හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
   iv. මතෙව් ශුභාරංචිය හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත

3. "එම්මැනුවෙල්" යන වචනයේ අර්ථය කුමක් ද?
   i. දෙවියන් වහන්සේ අප සමග ය.
   ii. දෙවියන් වහන්සේ අපගේ ජීවනය යි.
   iii දෙවියන් වහන්සේ ප්‍රේමය ය.
   iv. දෙවියන් වහන්සේ ජීවමාන ය.

4. මරියතුමිය ගැබ්ගෙන සිටින බව දැනගත් ජුසේතුමා එතුමියව රහසින් අත්හරින්නට තීරණය කළේ,
   i. ජුසේ තුමා සත්පුරුෂයෙකු බැවිනි.
   ii. සිහිනයකින් දේව දූතයකු දර්ශනය වූ බැවිනි.
   iii මරිය තුමියට ප්‍රේම කළ බැවිනි.
   iv. ජුසේ තුමා දාවිත්ගේ වංශයට අයත් වූ බැවිනි.

5. ස්නාවක ජොහන් තුමා අයකැමියන්ට දුන් අනුශාසනය වනුයේ,
   i. අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා.
   ii කිසිවකුට බොරු චෝදනා නොනගන්න.
   iii. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.
   iv. නියමිත පමණට වැඩියෙන් අය බදු නොගන්න.

6. හෙරෝද් රජ ස්නාවක ජොහන් මැරීමට අදහස් කළත් එසේ කිරීමට බිය වූයේ,
   i. ස්නාවක ජොහන් යහපත් මිනිසෙකු වූ නිසා ය.
   ii ස්නාවක ජොහන්ගේ ගෝලයින්ට බිය වූ නිසා ය.
   iii. ජනතාව ස්නාවක ජොහන් දිවැසිවරයෙකු ලෙස සැලකූ නිසා ය.
   iv. හෙරෝද් රජ වරද පිළිගෙන පව් සමාව ලබාගත් නිසා ය.

7. ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය අනාවරණය වූ අවස්ථාවක් වන්නේ,
   i. නාසරෙත් නුවර ජේසුස් වහන්සේගේ ප්‍රථම දේශනය යි.
   ii ජේසුස් වහන්සේ ජෝර්දාන් නදියේ දී බෞතීස්ම ස්නාපනය ලැබීම යි.
   iii. ජේසුස් වහන්සේගේ පළමු ප්‍රාතිහාර්ය යි.
   iv. ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාව යි.

8. රාජගුරුප්‍රසාදීන් වහන්සේ අපේක්ෂකයින් මත දෑත විහිදා ශුද්ධාත්ම වරම් පතා යාච්ඤා කරන්නේ,
   i. අභිවෘද්ධි ආලේපය දානය කරන පිළිවෙත තුළ යි.
   ii. බෞතීස්ම ස්නාපනය දානය කරන පිළිවෙත තුළ යි.
   iii. ආශිර්වාදකාර බන්ධනය දානය කරන පිළිවෙත තුළ යි.
   iv. දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙත තුළ යි.

9. සාමාන්‍යයෙන් අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව දානය කරනු ලබන්නේ,
   i. ඕනෑම පියතුමකු විසිනි.
   ii. මීසම්භාර පියතුමකු විසිනි.
   iii. රදගුරු තුමන් විසිනි.
   iv. ඥාණ මව්පියන් විසිනි.

10. දේව රාජ්‍ය තුළ දැකිය හැකි වටිනාකම් ජේසුස් වහන්සේ .................... මගින් ඉගැන් වූ සේක. හිස්තැනට සුදුසු වචනය වන්නේ,
   i. කතන්දර   ii ගීත   iii. ලිපි   iv. උපමා

11. ජේසුස් වහන්සේ විසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලද්දේ,
   i. කන්ද උඩ දේශනාවේදී ය.
   ii. කල්වාරි කන්ද මුදුනේදී ය.
   iii පන්දහසකට කෑම දුන් අවස්ථාවේදී ය.
   iv. අන්තිම රාත්‍රී භෝජනයේදී ය.

12. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර ............................ නිරාහාරශීලව සිටිය යුතු ය. හිස්තැනට සුදුසු යෙදුම වන්නේ,
   i. හැකි කාලයක්
   ii. පැය කිහිපයක්
   iii. පැය දෙකක්
   iv. අවම වශයෙන් පැයක්වත්

13. විශ්වාසයට එරෙහි අභියෝගවලට මුහුණ දී ඒවා ජයගැනීමට අවශ්‍ය ශක්තිය අපට ලැබෙනුයේ,
   i. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය තුළිනි.
   ii. රෝගීන්ගේ ආලේපය සක්‍රමේන්තුව තුළිනි.
   iii. අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව තුළිනි.
   iv. දිනපතා යාච්ඤා කිරීම තුළිනි.

14. ඉවසීම යනු,
   i. ශුද්ධාත්ම දීමනාවකි.
   ii. ශුද්ධාත්ම ඵලයකි.
   iii. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණයකි.
   iv. ස්නාවක ජුවම් තුමාගේ දේශනාවකි.

15. අප ප්‍රසාද සනාපනය ලැබුවේ,
   i. ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙනි.
   ii. ශුද්ධ ත්‍රිත්වයේ නාමයෙනි.
   iii. පියාණන් වහන්සේගේ නාමයෙනි.
   iv. ශුද්ධාත්මයාණන්ගේ නාමයෙනි.

16. දෙවියන් වහන්සේ ...................................... නො ඉවසන සේක. හිස්තැනට සුදුසු යෙදුම වන්නේ,
   i. ප්‍රතිවාදීන්   iii. පව්කරුවන්   ii. සතුරන්   iv. රෝගීන්

- හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස් තැන් පුරවන්න.
  ( ශුද්ධ ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේ, ශුද්ධ වූ පාවුලු තුමා, කෙරුබ්වරුන්ගේ, බාරය)

17. කිතුනු ජීවිතයේ කේන්ද්‍රීය අභිරහස වනුයේ ........................................ යි.

18. ගිවිසුම් කරඬුව අලංකාර කරන පිණිස සාදන ලද්දේ ........................................ රූපය යි.

19. දෙවියන් වහන්සේට ප්‍රසන්න අමතර යමක් කරන්නට ස්වකීය කැමැත්තෙන් වන පොරොන්දුව ........................................ යි.

20. අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ හිස වන්නේ ........................................ ය.

## II පත්‍රය

● පළමු ප්‍රශ්නය ඇතුළුව පශ්න පහකට පිළිතුරු ලියන්න.

1. සියලු ම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
   1. ශුද්ධ වූ ලුක් ශුභාරංචිය තුළ හමුවන ප්‍රශංසා ගීත දෙකක් ලියන්න.
   2. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්‍ෂණ දෙකක් ලියන්න.
   3. ශුද්ධාත්මයාණන් වහන්සේ හැඳින්වීම සඳහා පුරාණ ගිවිසුම තුළ භාවිත කළ යෙදුම් දෙකක් ලියන්න.
   4. කිතුනුවකු ලෙස ඔබ විසින් ප්‍රතික්ෂේප කළ යුතු මිත්‍යා ඇදහිලි දෙකක් ලියන්න.
   5. වපුරන්නා පිළිබඳ උපමාවේ බීජ වැටුනු ස්ථාන දෙකක් ලියන්න.
   6. මාරුත දමනය ප්‍රාතිහාර්ය මගින් අපට උගන්වන කරුණු දෙක ලියන්න.
   7. 'ලිටුර්ජියා' යන යෙදුම සෑදී ඇති ග්‍රීක වචන දෙක ලියන්න.
   8. මෙසියස් වහන්සේ පිළිබඳ දිවැස් වැකි ප්‍රකාශ කළ දිවැසිවරුන් දෙදෙනෙකු නම් කරන්න.
   9. පාළුකරයේදී ජේසුස් වහන්සේට මුහුණ දීමට සිදු වූ පරීක්ෂාවන් දෙකක් ලියන්න.
   10. අභිවෘද්ධි ආලේපය ලැබූ පරිණත කිතුනුවකු ලෙස ඔබ සාක්ෂි දැරිය යුතු ආකාර දෙක ලියන්න.

2.
   1. ශුද්ධ වූ ලුක් තුමා පමණක් සඳහන් කරන උපමා දෙකක් ලියන්න.
   2. දේව රාජ්‍යය තුළ දැකිය හැකි වටිනාකම් පිළිබඳ ජේසුස් වහන්සේ දේශනා කළ උපමා තුනක් ලියන්න.
   3. යහපත් සමාරියා පිළිබඳ උපමාවෙන් දරුවෙකු ලෙස ඔබේ ජීවිතයට උගතහැකි පාඩම් 5ක් ලියන්න.

3.
   1. දිව්‍ය සත්ප්‍රසාදයේ පූර්ව සලකුණු 2ක් ලියන්න.
   2. ජේසුස් වහන්සේ විසින් සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග 3ක් ලියන්න.
   3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම සඳහා ඔබ සූදානම් විය යුතු ආකාරය කරුණු 5ක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

4.
   1. අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් 2ක් ලියන්න.
   2. ශුද්ධාත්ම දීමනා 3ක් ලියන්න.
   3. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය ලබන්නන්ට ලැබෙන දීමනා 5ක් කෙටියෙන් විස්තර කරන්න.

5.
   1. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව කිතුනු පවුලට පැවරෙන වගකීම් දෙකක් ලියන්න.
   2. ශුද්ධ ත්‍රිත්වය තුළ අපට හමුවන තුන්දෙනා වහන්සේලා නම් කරන්න.
   3. දෙවියන් වහන්සේට සමීප වීම සඳහා අපට කළ හැකි දේවල් 5ක් කෙටියෙන් විස්තර කරන්න.

6.
   1. ජනවන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියන්න.
   2. දිව්‍ය පූජාව තුළ අපට හමුවන පිළිවෙත් තුනක් ලියන්න.
   3. දිව්‍ය සත්ප්‍රසාද ආකාරයෙන් ඔබ තුළට පැමිණි ජේසුස් වහන්සේට ස්තුති කරමින් දිව්‍ය පූජාව අවසානයේදී කිව හැකි යැදුමක් ලියන්න.

7. තෝරාගත් මාතෘකා දෙකක් යටතේ කෙටි සටහන් ලියන්න
   1. පෙන්තකොස්ත දිනය
   2. සාන්තුවර බැතිය
   3. යාම යැදුම
   4. ස්නාවක ජොහන්තුමා